## බස්නාහිර පළාතේ 1992 අංක 04 මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

## FINANCIAL (AMENDMENT) STATUTE OF WESTERN PROVINCE, NO; 04 OF 1992

1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝදනය කිරීම සඳහා වූ ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ බනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 1992 අංක 04 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. "සංශෝධිත වූ පරිදි වූ 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනත සහ" යන වචන ඉවත් කර ඒ වෙනුවට මෙසේ වචන ඇතුළත් කිරීමෙන් 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය මෙයනි සංශෝධනය කරනු ලැබේ. — 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

"සංශෝධිත පරිදි වු 1982 අංක 43 දරණ මුදදර ගාස්තු පනත, සංශෝධිත පරිදි වූ සුරාබදු ආඥාපනත. සංශෝධිත පරිදි වූ මහනගර සභා ආඥාපනත, සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනත, සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත"

3. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලත්වයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අංක 01 සිට 03 දක්වා ඡේදයන් ඇතුළත් මෙම ප්‍රඥප්තිය 1992.11.24 වෙනි දින පැවැති බස්නාහිර පළාත් සභා රැස්වීමේදි සභා සම්මත වූ බැව් සහතික කරමි.